**මොරටුව මහා නගර සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මොරටුව මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 6/2155 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවන ලද මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 84 හා මහා නගර සභාව විසින් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය -2017 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර හඳුන්වා දෙන ලද ආකෘති සහ කේත අංක ද භාවිතා කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 හා අංක 6/2155 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රවර්තන මූල්‍ය කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා පූර්ව වර්ෂයට සමාන කළ හැකි තුලනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | තුලනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව 2020 ජනවාරි 01 දිනට ආරම්භක වත්කම් සහ වගකීම් ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ පැවති තත්ත්වය නිසා කාර්ය මණ්ඩලය සාමාන්‍ය පරිදි කැඳවීම් කිරීමට තිබූ බාධා | ප්‍රමිත හා ගැසට් පත්‍ර ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | හේතුවෙන් 2020වර්ෂය තුළදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට සියයට 100 ක් අනුගත වීමට නොහැකි වූ බැවින් 2020 ජනවාරි 01දිනට ආරම්භක වත්කම් සහ වගකීම් ප්‍රකාශයක් සභාවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දන්වා සිටිමි. | |
| (ඈ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 6.15 ඡේදය අනුව පිළිගත හැකි ක්ෂය කිරීමේ ක්‍රමයක් සභාව විසින් තීරණය කළයුතු වුවත් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැරව කටයුතු කිරීම සහ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් දේපළ ,පිරියත හා උපකරණ සඳහා 2020 වර්ෂයේ ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. | 2020 අයවැය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව සාදා නොමැති බැවින් එහි ක්ෂය සඳහා වෙන්කිරීම්ද සිදු කර නොමැත. තවද වත්කම් ප්‍රත්‍යාගණන සිදු නොකිරීම හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට ගිණුම සකස් කිරීම සඳහා සියයට 100 ක් අනුගත නොවීම මත 2020 වර්ෂයේ ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. 2021 ගිණුම සකස් කිරීමේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ක්ෂයවීම් ගිණුම්ගත කරන බවද දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිත හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට භාවිතා කළ පදනම හා භාවිතා කළ ක්ෂය කිරීමේ ක්‍රමය හෙළිදරව් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව හෙළිදරව් කළ යුතුවේ. |

**1.6.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය අනුව අතිරික්තය රු.24,003,920 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අතිරික්තය ලෙස ගෙන ඇති වටිනාකම රු.92,471,139 ක් වූයෙන් වර්ෂයේ මුදල් හා | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අනුව අතිරික්තය රු.24,003,920 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සාදා ඇත්තේ පැරණි ගිණුම් ප්‍රමිත අනුවයි .ඒ අනුව අතිරික්තය ලෙස ගෙන ඇත්තේ | නිවැරදි ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම රු.68,467,219 ක් වැඩියෙන් ගණනය කර තිබුණි. | පුනරාවර්තන වියදම් හා පුනරාවර්තන ආදායම් අතර වෙනස රු.92,471,139 ක් පමණි. මෙය නව ආකෘතියට දත්ත ඇතුළත් කිරීමේදී සිදුවූ දෝෂයක් වන අතර එය 2021 ගිණුම සකස් කිරීමේදී නිවැරදි ආකාරයට සිදුකරන බව දන්වා සිටිමි . | |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේදී වාර්ෂික ක්ෂය, ස්ථාවර තැන්පත් පොළී, ණය පොළී ,දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම, දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් හා ලාභ අලාභ ආදීය ගැළපුම් කර නොමැති බැවින් වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /අඩුවීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | නව ආකෘතියට තොරතුරු ඇතුළත් කිරීමේදී ඇතිවූ දෝෂයක් වන අතර එමගින් මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම හෝ අඩුවීම කෙරෙහි බලපෑමක් ඇති නොවූ තත්ත්වයකි. මන්ද මෙහි වසර සඳහා වූ අතිරික්තයේ මේ සියල්ල ගැලපී ඇති බැවින් මුදල් හා මුදල් වලට සමාන දෑ නිවැරදි මුදල සටහන් වී ඇත . කෙසේ නමුත් 2020 වර්ෂයට ක්ෂයවීම්වලට අදාළ වෙන් කිරීමක් සිදුවී නොමැති බැවින් ක්ෂය වීම පමණක් ගලපා නොමැති බව දන්වා සිටිමි .තවද 2021 ගිණුම සකස් කිරීමේදී නිවැරදි ආකෘතියට අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතුකළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට බැංකු අයිරා ශේෂය රු.28,158,873 ක් වුවද එය වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ කෙටිකාලීන ගෙවිය යුතු දෑ යටතේ දක්වා තිබුණද වෙනම අයිරා ශේෂය ලෙස දක්වා නොතිබුණි. | වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ලබා දී ඇති ආකෘතියට අනුව බැංකු අයිරා ශේෂය කෙටිකාලීන ගෙවිය යුතු දෑ යටතේ පෙන්නුම් කර ඇත. 2021 ගිණුම සකස් කිරීමේදී බැංකු අයිරාව වෙනම පෙන්වීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| සේවක ණය | 49,432,162 | 46,155,089 | 3,277,073 | සේවක ණයගිණුම්වල ශේෂ හා උපලේඛණ අනුව ශේෂ අතර පවතින වෙනස හඳුනාගෙන ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වම්. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂය නිවැරදි කළ යුතුවේ. |

## 1.6.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනත 252 අධිකාරය 188(1) උපවගන්තියට අනුව මහා නගර සභා අරමුදල ප්‍රයෝජනයට ගත නොහැකි ආකාරයේ ගණුදෙනුවක් වන සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී සභා අරමුදලින් පිළිවෙලින් රු.953,715 ක් හා රු.1,086,807 වශයෙන් එකතුව රු.2,040,522 ක්ගෙවීම් කර තිබුණද සභාවට අයවිය යුතු රු.1,703,022 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188(1) උපවගන්තියට පටහැනිව කටයුතු කිරීම නිසා සිදුවී ඇති පාඩුව අයකළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 156 | 2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.1,549,200 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර 2015 සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී සභාව විසින් ගෙවන ලද රු.1,088,565 ක් සහ ඉතිරි මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මු.රෙ.156 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,003,920 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.36,007,882 ක් විය.

2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.210,216,132 ක් වු අතර ඉන් වරිපනම් වටිනාකම රු.50,000 ඉක්ම වු වරිපනම් ඒකක 372 කින් අයවිය යුතු වටිනාකම රු.85,434,110 ක් විය. | අදහස් දක්වා නොමැත. | මහා නගර සභා ආඥාපනතේ 252 (1) (ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සැහැල්ලු කසළ ඉවත් කිරීම වෙනුවෙන් සභාබල ප්‍රදේශයේ ආයතන 722 කින් ලැබිය යුතු රු.38,305,771 ක හිඟ ශේෂයන් (බදු රහිත) සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .මෙම ශේෂය තුළ 2012 වර්ෂයේ සිට 2019වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු රු.25,663,826 ක් ඇතුළත්ව තිබුණි . | අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | පානදුර ප්‍රාදේශීය සභාවේ කසළ, කරදියාන කසළ අංගනය වෙත බැහැර කිරීම වෙනුවෙන් 2013 සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව එම සභාවෙන් ලැබිය යුතු (බදු සහිත) රු.1,297,188 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි . | අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ඉන්ධන ශේෂය රු.133,100 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | රු.75,000 ක ශේෂය අය වීමට ඇත්තේ හිටපු නාගරික මන්ත්‍රීවරයකුගෙන් වන අතර ගොනුව නීති අංශයට යොමු කරන ලදුව ඔහු විදේශගත වී ඇති බවත්, ඔහුට විරුද්ධව නීතිමය පියවර ගැනීමට ඔහුට අදාළ දේපළ ඔහු නමින් නොමැති බවත් දන්වා එවන ලදී .අනතුරුව ඔහු විදේශගත වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා ඇත .නමුත් මේ දක්වා ඒ සඳහා පිළිතුරක් ලැබී නොමැත.<br>ඉතිරි මුදල් අය වෙමින් පවතී. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

2.3 අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සහා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර වෙනුවෙන් 2020 දෙසැම්බර් 31දිනට රු.760,173 ක් අයකර ගැනීමට තිබූ අතර එම මුදල 2020 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | නාගරික මන්ත්‍රීවරුන්ට මුද්දර දීමනා ගෙවීම හේතුවෙන් පැන වූ අධිභාර වෙනුවෙන් මුදල් අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතී.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වැඩ බැලීමේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තොරතුරු අප සතුව නොමැති හෙයින් ,අදාළ තොරතුරු සොයා බැලීමෙන් පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් අංශයේ පරිගණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් පොදු මුරපදය (Common Pass word) භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10කදී රු.105,893 ක් වටිනා බිල්පත් අවලංගුකර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි .මාණ්ඩලික නිළධාරියෙකු සතුව පැවතිය යුතු රහස් මුර පදයද (Secret Pass word) ව්‍යාජ ලෙස භාවිතා කර තිබුණි .සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අක්‍රමිකතා වැලැක්වීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කම්පැක්ටර් රථයට 1999අගෝස්තු 10 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් අගතියටපත් පාර්ශවයට රු.3,001,717 ක් ගෙවීමට වැරදිකරු වූ සභාවේ රියදුරුට නියම වී තිබූ | රිය අනතුර සඳහා අධිකරණ ක්‍රියාවලියකින් පසුව ගෙවන ලද වන්දි මුදල් සහා අනුමැතිය පරිදි මෙම රියදුරුගෙන් වාරික වශයෙන් අයකිරීමට කටයුතු කර තිබූ අතර, | මූලික විමර්ශනයන් සිදුකර අලාභය අයකර ගත යුතුවේ. |

| | | |
|---|---|---|
| අතර එම මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි. 2019 පෙබරවාරි 28 දින වන විට රියදුරුගෙන් රු.112,205 ක් පමණක් අයකරගෙන තිබුණු අතර 2019 මාර්තු සිට අයකිරීම් නතර කර තිබුණි .ඒ අනුව සභාවට අයවිය යුතු රු.2,889,512 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැවත එම වාරික මුදල් අයකිරීම ඉවත් කර සහනයක් සලසා දෙන ලෙස ආයතන කමිටුව මගින් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කර තිබුණි.<br>විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඒ අනුව පහත සදහන් නිර්දේශයන් ලබා දී ඇත.<br>මහා නගර සභා ආඥා පණතේ 302 හා 310වගන්ති කෙරෙහි අවධානය යොමු කරමින් රියදුරු මහතා කෙරෙහි සානුකම්පිතව සළකා අවශ්‍ය සාධාරණයක් ලබාදීම කෙරෙහි සභාව අවධානය යොමු කිරීම යුක්ති සහගත බවත් ඔහු වෙනුවෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන බවත් නිර්දේශ කර ඇත. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ද සොයිසා ක්‍රීඩාංගනය තුළ "මොරටුව ක්‍රීඩා සමාජය" නමින් දෙමහල් ගොඩනැගිල්ලක් ස්ථාපනය කර බදු දී තිබූ අතර ගොඩනැගිල්ල සභාවේ අවසරයකින් තොරව තෙවැනි පාර්ශවයක් වූ සමාජ ශාලාවකට (Club House) හා ශරීර සුවතා මධ්‍යස්ථානයකට "මොරටුව ක්‍රීඩා සමාජය" විසින් උපබදු දී මසකට පිළිවෙළින් රු.25,000 ක් හා රු.30,000 ක් වශයෙන් මාසිකව එකතුව රු.55,000 ක් බැගින් උපයා තිබුණි. එමෙන්ම ක්‍රිකට් තරඟ පවත්වන දිනවල මොරටුව ක්‍රීඩා සමාජය විසින් විශාල මුදලක් උපයන බවත් සභාව විසින් උපයාගතව හැකිව තිබුණු ආදායමක් මෙසේ බාහිර පාර්ශවයන් විසින් උපයා ගනු ලබන බවත් නිරීක්ෂණය විය. | ද සොයිසා ක්‍රීඩාංගනය මොරටුව මහා නගර සභාව සතු නීත්‍යානුකූල දේපළක් බැවින් දැනට එම භූමියෙහි පවත්වාගෙන යනු ලබන මොරටුව ක්‍රීඩා සමාජය සතු සියළු බඩු බාහිරාදිය ඉවත් කර ගෙන ගොඩනැඟිල්ලේ අයිතිය මෙම සභාව වෙත භාරදෙන මෙන් එම ක්‍රීඩා සමාජයට දන්වා යවා ඇත.<br>ඉන්පසු දිවයිනේ ඇති වී තිබෙන කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය නිසා මේ පිළිබඳව කටයුතු කිරීම මේ වන විට තාවකාලිකව ඇණ හිට ඇත . තත්ත්වය සමනය වූ පසු ඔවුන් මෙම භූමියෙන් ඉවත් නොවන්නේ නම් නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | |